දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් දිනපතා පාහේ මාධ්‍ය තුළින් අසන්නට, දකින්නට ලැබේ. පර්යේෂණ මගින් මේ වන විට පෙන්වා දී ඇත්තේ, දිවි තොර කර ගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බවයි. ඒ අනුව, දිනපතා එවැනි පුවත් වලට නිරාවරණය වන පාඨකයින් හට එම පුවත් වලින් සිදුවිය හැකි බලපෑම අවම කිරීමත්, අනුකාරක දිවි තොර කරගැනීම් අවම කිරීමත් මාධ්‍ය සතු සමාජ වගකීමක් නොවන්නේද?

ඒ බව සැලකිල්ලට ගනිමින් මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළ සඳහන් කෙරෙන්නේ, දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී ප්‍රවේසම් සහගත සහ ආචාර ධර්මානුකූල ප්‍රවේශයක් අනුගමනය කරන ලෙසයි. නමුත් පසුගිය අරුණ (11/4) සහ දිවයින (11/4) පුවත්පත් වල පළ වී තිබූ දිවි තොර කරගැනීම් වාර්තා තුළින් නිරීක්ෂණය කෙරුනේ, දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ ඇතැම් මාධ්‍ය ආචාර ධර්ම එහිදී අනුගමනය වී නොතිබූ බවයි.

1) දිවි තොර කරගත් ආකාරය වාර්තා කිරීමෙන්, එම ආකාරය අනුගමනය කරමින් සිදුවන අනුකාරක දිවි තොර කරගැනීම් වලට අනුබලයක් ලැබිය හැක.

2) දිවි තොර කරගත් පුද්ගලයාගේ මළ සිරුරෙහි ඡායාරූප පළ කිරීම ඔස්සේ, ඇතැම් විට දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයකින් සිටින අයෙකුට පසුකාලීනව දිවි තොර කරගැනීමට උත්ප්‍රේරණයක් ලැබීමේ ඉඩක් ඇත.

3) දිවි තොර කරගැනීමක් පසුපස සංකීර්ණ හේතු සාධක තිබේ. එසේ නම්, දිවි තොර කර ගැනීමට හේතු අතිසරල කොට දැක්වීම ඔස්සේ, එවැනි සිදුවීම් වලට මුහුණ දෙන තවත් අය අතර දිවි තොර කරගැනීමේ පෙළඹවීම් ඇතිවීමේ අවදානමක් ඇත.

4) දිවි තොර කරගැනීමේ පුවතක් කියවූ යම් අයෙකුට, දිවි තොර කරගැනීමේ පෙළඹවීමක් තිබේ නම්, ඉන් ඔවුන් මුදා ගැනීමට,එම පුවතත් සමඟ හදිසි උපකාරක අංක පළ කිරීම වැදගත් වේ. උපකාරක සේවයක් සම්බන්ධ කරගැනීමෙන් ඔවුන්ට යම් මානසික සහනයක් මෙන්ම, දිවි තොර කරගැනීමේ සිතුවිලි වලින් මුක්ත වීමටද රුකුළක් ලැබිය හැක.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...